"කොහෙන්ද අර ඊයෙ රෑ දෙගොඩහරි ජාමෙ ටෙලිෆෝන් කෝල් එකක් ආවෙ. ? පින්සල ඇඳේ ඉඳගෙනම පන්හිඳගෙන් ඇහුවා. ඇහැරලා හිටියත් පන්හිඳ තාම ඇඳේ.

"අර අපිත් එක්ක ඇරෑගම ඉස්කෝලෙ හොඩියේ පන්තියේ උන්නු නිමල්ගෙන්." පන් කෙටි කාලයකුයි හෝඩියේ පන්තියේ උන්නෙ. ඒ කෑගල්ලේ, කුරුම්බාපිටියේ ඇරෑගම ඉස්කෝලෙ.

"නිමා ? කොහෙන් ද අප්පච්චියේ ටෙලිෆෝන් නොම්මරේ හොයාගෙන තියෙන්නෙ ? ඇයි හදිසියෙන් ? පැන්සලත් කතාවට එකතු වුණේ ඇඳේ ඉඳන්මයි.

"ඒක තමා කියන්නෙ. කොහෙන්දෝ හොයාගෙන. ඊයෙ රෑ ලංකාවේ ස්වාධීනෙ රූපවාහිනියෙන් අර ලයනල් රන්වල මහත්තයාගේ නිර්මාණ ගැන කතා කරපු "සංහිඳ" වැඩ සටහන ආයෙ ප්‍රචාරය කරලා. නිමා ඒක බලන ගමන් තමයි මෙහාට කතා කළේ. අපේ පැය පහමාරෙ වෙලාවේ වෙනස ගැන මිනිහට නිනව්වක් නෑනේ."

"ඊට පස්සෙ එළිවෙනකල් නින්ද ගියේම නෑ. ඒ වුණත් නිමා කතා කරපු එක ගැන හරි සතුටුයි. එළිවෙනකල් අපි පුංචි කාලෙ අපි ඔය ගම් පළාත්වල කරපු කියපු

"තැටිය එළිදැක්වීමයි ඊළඟට කළේ. සුපුරුදු දේශනයක් වෙනුවට රඟපෑමකුත් එක් කරගෙන අපේ ශ්‍රීනාත් මද්දුමගේ රංගන ශිල්පියා ජන ගී කීපයක් ගායනා කරමින් තමයි එළිදැක්වීමේ කතාව කළේ. ඒ කතාවේ අගටත් තව ළමිස්සියක් එක්ක රඟපෑමක් එකතු කරගෙන තිබුණා."

"මුළු උත්සවයටම ඉදිරිපත් කළේ කුසුම්සිරි ලියනාරච්චි කලාකරුවා."

ප්‍රසංගය පටන් ගත්තෙ තරුණ ගැටව් දෙන්නෙක් දවුලකුයි රබානකුයි වාදනය කරන තාලෙට ගායනා කරපු විරිඳු පෙළකින්. මුළු ප්‍රසංගය පුරාම ඉදිරිපත් කරපු ජන ගායනා සුදාර පුතා වගේම අනික් දරුවොත් කටපාඩමින් තමයි ගායනා කළේ. හරි තාලයට හරියට උච්චාරණය කරලා මේ ගායනා කරපු හැටි දැක්කම ඇත්තටම පුදුම හිතෙනවා. මොකද මේ ළමයි හැදෙන්නේ ඉංග්‍රීසි වටපිටාවකනෙ. හුඟ දෙනෙක් ඉපදිලා තියෙන්නේ මෙහේමයි."

"වේදිකා සැරසිලි ගැනත් කියන්න ඕන." ඒ පින්. ගොක් කොළවලින් සැරසිලි කළා වගේ ඒ පාටට කපපු පටිවලින් වියපු පැලැල්ලක් තමයි සංගීත වාදනය කරන අය ඉස්සරහා තියලා තිබුනේ. කෙහෙල් කොටන්වලට ගොක් කොල ගහලා



# උදාරයි සුදාර !

දේවල් මතක් වුණා." පන්ගේ දෙමව්පියන්ගේ ගම් පළාත් ඔය කෑගල්ල, නුවර පළාත්වල. ඒ ගම්වල අපේ නියම සිංහල ගැමියෝ එක්ක ගත කරපු ඒ නිවාඩු කාල ගැන මතකයෙන් පන්ගේ හිත පිරිලා.

"ඒක තමයි එළිවෙන ජාමෙ ගොරොද්දෙ දෙනවා ඇහුණෙ." පින් ඇඟට නො දැනී කිව්වා.

"දෙගොඩ හරි ජාමෙ ටෙලිෆෝන් එකට ඇහුරුණ එක ගැන තියෙන එකම දුක මං ඒ වෙලාවේ හොඳ ලස්සන හීනයක් දැක දැකයි උන්නෙ. අපරාදෙ ඒක."

"මොකද චිත්‍රලතාලවත් උන්නද ඒ හිනෙ ?" ඒ පැන්.

"අනේ නෑ. ඒක මහ පුදුම හීනයක්. කවුදෝ හුරුබුහුටි ලස්සන කොලු පැංචෙක් ලස්සනට ඇඳ පැදලා අපේ ජන කවි කියනවා. හරියට අපිට අර කෑගල්ලේ කුරුම්බාපිටියෙදි, මැද මහනුවරදි මුණ ගැහුණ කොලු රෑනෙන් එකෙක් වගේ. ඇඳලා උන්නෙත් පුංචි සරම් කෙටියකුයි අර ජාතියෙ කමිසෙකුයි. ඔළුවේ සුම්බරයකුත් බැඳගෙන."

"තව කිව්වනං බලන්න....." පැන්ගේ කට කොනේ හිනාවක්.

"ඇස්වහක්, කටවහක් ගන්න හොඳ නෑ; මේ කොලු පැංචා ජන කවි කිව්වේ රඟපාන ගමන්. සමහර වෙලාවට බෙර පදේට අඩිය තියලා නටන ගමන්. ඒ වටේට තවත් පුංචි උන් රෑනක්. ඒ ඈයොත් අර පැංචාට ම ගැලපෙන්න නටනවා, රඟපානවා, ගායනයෙනුත් හවුල් වෙනවා. ඒ අය ඇඳලා උන්නෙත් අර වාගෙම ගමේ ඇඳුම්....."

"පොඩ්ඩක් හෝව් ! පොඩ්ඩක් හෝව් ! පන් ඔය දැකලා තියෙන්නේ හීනයක් නෙවි. පෙරේදා රෑ අපි බලන්න ගිය සුමියුරු සිහල ජන ගී සී.ඩී. එක එළි දක්වපු ප්‍රසංගයේ රිපීට් එකක් ද කොහෙද." පැන් පින්ගේ හීනෙ විස්තරේට බාදා කළා.

"හරියට අර ලයනල් රන්වල මහත්තයාගේ නිර්මාණ ගැන අපි කතා කරපු "සංහිඳ" රිපීට් වුණා වගේ.....?" පන්ට පුදුමයි.

"එක අතකට සුදාර පුතාගේ ඒ වැඩෙත් හීනයක් එළිවුණා වාගේ තමයි."

"හීනේ ගැන නෙවි, ප්‍රසංගය ගැන ටිකක් මතක් කළොත් නරක ද එහෙනං ?" ඒ ගැන ලියනවට වැඩිය පින්, පැන් එක්ක විස්තර කතා කළානං හොඳා කියලා හිතුනා.

"හරියටම කියපු වෙලාවට පටන් අරගෙන වැඩිය ඇදෙන්නෙ නැතිව ලස්සනට ඉවර කරපු ප්‍රසංගයක් ඒක." පැන් තමාට වැඩියෙන්ම දැණුන දේ කිව්වේ එහෙම. අනික වෙන එළි දැක්වීමේ උත්සවවලට වඩා වැඩ පිළිවෙලත් වෙනසක් තිබුණානේ."

"මගුල් බෙර මැද්දේ සම්ප්‍රදායේ විදියට පහන පත්තු කළත් ප්‍රසංගය පටන් ගන්න කලින් සංගත තැටිය ඒ ඒ ආරාධිතයන්ට පිළිගැන්නුවා."

ගෝලාකාර විදියට හදන ගොක් ගෙඩි වාගේම මෙහේ දේවල්වලින් සැරසිලි හදලා ඒ පැලැල්ල ඉසස්සරහා තියලා තිබුණා. ඒ ඇතුලේ පහන් පත්තුවෙනවා වගේ පේන්න පුංචි බල්බ් පත්තු වෙනවා. පැත්තක ගහක් උඩ පැලක්. ඒකට නගින්න ඉනිමගකුත් එක්ක. අනික් පැත්තේ ලොකු උණ පඳුරක්. ඒ පඳුර යට ඔරුවකුත් ගැට ගහලා. මේ ඇත්තටම වේදිකාවක්ද කියලත් අමතකවෙන තරම්."

"මේවා ඔක්කොම සුදාරගේ පියා, නන්දසිරි ද සිල්වා කියන මෙල්බන් කලා කරුවාගේ වැඩ තමයි."




"ඔය කියනකොටයි මතක් වුණේ ප්‍රසංගය පවත්වන්න කලියෙන්නෙ ස්තූති කතාව කළෙත් !" පැන් මතක් කළා.

දරුවගෙ අම්මයි තාත්තයි දෙන්නා එකතු වෙලා මාරුවෙන් මාරුවට තමුන්ට උර දුන් අයට ස්තූති කරපු හැටි අගෙයි. වෙන ස්තූති කතාවල් වගේ අහගෙන ඉන්න අමාරුවක් තිබුණෙ නෑ."

"මේ වැඩේට යොමු කරපු "මිහිඳු ළමා පදනමේ" විනිතා විජේරත්න ලංකාවෙදි ගායනා පුහුණු කරපු විශාරද ඉන්ද්‍රාණී විජයලතා, මෙහෙදි ගායනාවලට උදව් දුන්න වාසනා වීරකෝන් වාගේ නෝනාමහත්තුරුන් ගණනාවක් මේ සද්කාර්යයට දායක වෙලා. "

මේ සම්පූර්ණ ප්‍රසංගයේ පිටපත ලියා ගීත තෝරාගෙන ඉදිරිපත්කිරීමේ ආකෘති පවා නිර්මාණය කර සියළුම දරුවන් පුහුණු කළ නන්දසිරි ද සිල්වා කලාකරුවා ගැන විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෙ.

"ඒ වගේම සැරසිළිවලට, සංවිධාන කටයුතුවලට, ඡායාරූප, වීඩියෝ ගතකිරීම්වලට, ආලෝකය, ශබ්දය පාලනය කල අයට, නිවේදන කටයුතු කළ අයට හැමෝටමත් ස්තූතිය පිරිණැමුණා. ඇයි සංගීතය කියපු අයට?, නැටුම් පුරුදු කරපු චලංක අතලගේ මහත්තයට?"

"විරිඳුවලින් පස්සේ ඉදිරිපත් කළේ තුන්සරණේ කවි. තම්මැට්ටමයි, උඩරට ගැට බෙරයයි තමයි පැත්තකින් වාදනය වුණේ. ඉන්දික පර්දිනාන්දු මහත්තයයි සුදාරගේ අයියා උදාරයි තමා බෙර වාදනය කළේ. ඔය අතරට නාලක වීරකෝන් මහත්තයාගේ බටනලාවේ හඬත් එකතුවුණා. රසංග වඩුගේ අසංග ලියනගේ මහත්තුරු ගිටාර් වාදනය කළා. මේ අයව වෙන ම හඳුන්වලා දෙන්න කුසුම්සිරි ලියනාරච්චි මහත්තයා අමතක කළේ නෑ."

"පතල් කවි කියන කොට පතලක දොඹකරයේ ඉහල පහල යවන පට්ටලයකුත් වේදිකා සැරසිල්ලක් විදියට ඉදිරිපත් කළා. ඒකෙන් ඒ කවිවලින් මවන පරිසරය අපූරුවට පෙන්නන්න නන්දසිරි මහත්තයා හපන් වුණා. පසුබිමෙන් මිනිරන් කඩන කොට මිටිවලින් එන ශබ්දය, දෝංකාරය එහෙමත් අහන්න ලැබුණා."

"අර අනික් දරුවන් එක්ක නටපු වෙලාවෙ සුදාර අගේට හොඳ අඩියක් එහෙම බෙරපදේට නැටුවා." පැන් කතාවට හවුල් වුණේ විටින් විට. "ඒ වාගේ කිසිම නවක බවක් තිබුණේ නෑ ඇත්තටම. ළමයින්ට අන්දවලා ගත්තම හරියට අපි ලංකාවෙ ගමේදි දැකපු චරිතම මතක් වෙනවා. රඟපෑමත් ඒ වාගෙමනෙ. මේවා මේ ළමයන්ට ඒ විදියටම ලැබුණ එකනෙ පුදුමෙ."

"විවේකයෙන් පස්සේ පැල් කවි, පාරු කවි එහෙමත් කිව්වා. දරුවෝ කීපදෙනෙක් නැගපු පාරුව වේදිකාවේ කෙළවරක ඉඳන් අනික් කෙළවරට ගියේ කොහොමද කියලා දෙයියො තමා දන්නෙ. පාරුවේ ඉඳන් තමා සුදාර පුතා පාරු කවි කිව්වෙ. රජ්ජුරුවන්ට රජ ඇඳුම් අන්දනවා වෙනුවට සාමාන්‍ය ළමයෙකුට කොස් කොළ ඔටුන්න දාලා එයාටයි ප්‍රශස්ති ගායනා කළේ. හැබැයි රාජ සභා මණ්ඩපයක ප්‍රශස්ති කියනවා වගේම රඟපෑවා අපේ දරුවෝ ටික. හොඳ අදහසක් ඒකත්. ඉතින් ඔය වාගේ කවි, සැහැලි, සව්දම්, වන්නම් ගායනා, නැටුම්, රඟපෑම් හරියට ගැලපුණ හොඳ පුංචි ප්‍රසංගයක් ඒක." පන් මොකද කියන්නෙ කියලා පින් පන්ගේ මූණ බැළුවා.

"ඒක ඇත්ත. මේ වාගේ මේ දරුවන්ව මේ දේවල්වලට යොමු කරන මේ දෙමව්පියන්ට, මේවා පුරුදු පුහුණු කරවන ගුරුවරුන්ට, මේවාට අතහිත දෙන වැඩිහිටි හැමෝටම අපි ස්තූතිවන්ත වෙන්න ඕන. අපිට මේ දේවල් බලන්න ලැබුණේ ඒ අය හන්දනේ. ඒ කාලෙ කටින් කට ආව, මේ කවි පබැඳුවෙ කවුද කියල අපි දන්නෙ නෑ. මොනවා වුණාත් මේ වාගේ කවි දහස් ගණන් මේ රට වටේ ගිහින් එකතු කරගෙන අපේම කියලා ජන සංගීතයක් ගොඩනගන්න ඇප කැපවුණ ඩී.බී. මකුලොළුව මහත්තයා, ඒ මහත්තයාට එකතු වුණ සී. ද ඇස්. කුලතිලක මහත්තයා වාගෙ අයට අපි පින් දෙන්න ඕන. ඒ අය මේවා පොත් පත්වල ලිව්වැයින්නේ අපේ දරුවන්ට මේ හපන්කම් පෙන්නන්න මේ විදියට ඉඩ ලැබුණෙ. ඒකට ම උර දුන්න රෝහණ බැද්දගේ, ලයනල් රන්වල වාගේ මහත්තුරුන්ටත් පින් දෙන්න ඕන මේ දේවල් ඉදිරියට අරන් ආවාට. ඒ වගේම අදටත් ලංකාවේ අපේ ජන සංගීතය ගැන උනන්දුවෙන තරුණ කණ්ඩායම් කීපයක්ම ඉන්නවා. ලෝකයේ හොඳම ජන සංගීත කණ්ඩායම විදියට රටවල් 66ක් අතරින් තේරුණේ අපේ මව් රටේ සහන් රන්වල ඇතුලු රන්වල බලකාය. ඉතින් ඒ අයත් මැයි මාසේ "ගම අවුලඤද්ඤදං" ප්‍රසංගය අරගෙන මෙල්බන් එනවා කියන සුභාරංචියත් මතක් කරන්න වටිනවා.




